# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතනය
## (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)

**2000 අංක 21 දරන ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අජිත් පී.පෙරේරා මහතා විසින්
2013 ඔක්තෝබර් මස 08 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 සැප්තැම්බර් මස 30 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[268 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)

**2000 අංක 21 දරන ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

*පූර්විකාව.*

ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය, 2000 අංක 21 දරන ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) පනත මගින් සංස්ථාගත කරන ලද හෙයින් ද:

තව ද, එකී ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය සිය නාමය "ශ්‍රී ලංකා වරලත් බඳුකරණ ආයතනය" ලෙස වෙනස් කිරීමට අදහස් කර ඇති හෙයින් ද:

තව ද, එකී ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය සිය නාමය එසේ වෙනස් කිරීම බලාත්මක කිරීමේ කාර්ය සඳහා ඉහත කී පනත සංශෝධනය කිරීම සඳහා ඉල්ලුම් කර ඇති අතර, එකී ඉල්ලීම ඉටු කිරීම යෝග්‍ය වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 2013 අංක  දරන ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*2000 අංක 21 දරන ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) පනතට කරනු ලබන සාමාන්‍ය සංශෝධනය.*

2. (මෙම පනතේ මින් පසු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2000 අංක 21 දරන ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) පනතේ දීර්ඝ නාමයේ හැර, එම පනතේ හෝ ඒ පනත යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් රීතියක, දැන්වීමක හෝ වෙනත් ලේඛනයක හෝ ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය යන නාමයෙන් හෝ එහි යම් කෙටි නාමයකින් හෝ "ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය" සම්බන්ධයෙන් සඳහන් කර ඇති සෑම පද සම්බන්ධයක දී ම, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස "ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා වරලත් බඳුකරණ ආයතනය" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

*කොන්ත්‍රාත්තු, ගිවිසුම්, නඩු පැවරීම, අභියාචනා, අයිතිවාසිකම් සහ වගකීම් යනාදිය.*

3. (1) මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව "ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය" විසින් හෝ එකී නාමය වෙනුවෙන් සාදනු ලැබූ, නිකුත් කරනු ලැබූ හෝ ලියා අත්සන් කරනු සෑම කොන්ත්‍රාත්තුවක් ම, ගිවිසුමක් ම, සහතිකයක් ම හෝ වෙනත් සාධන පත්‍ර හෝ කවරාකාර හෝ ලේඛන මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින හෝ ඉන්පසු ශ්‍රී ලංකා වරලත් බඳුකරණ ආයතනය විසින් හෝ එකී නාමයෙන් සාදනු ලැබූ, නිකුත් කරනු ලැබූ හෝ

2—PL 007589—75 (2013/09)

ලියා අත්සන් කරනු ලැබූ කොන්ත්‍රාත්තු, ගිවිසුම්, සහතික හෝ සාධන පත්‍ර හෝ කවරාකාර හෝ ලේඛන වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(2) "ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය" විසින් හෝ ඊට එරෙහිව පවරන ලද සහ මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම අවසන් නොවී පැවති සියලු නඩු, නඩුකර, අභියාචනා සහ අනෙකුත් නීති කෘත්‍යයන් නතර නොවී නොකඩවා පවත්වාගෙන යා යුතු අතර, ඒවා "ශ්‍රී ලංකා වරලත් බඳුකරණ ආයතනය" විසින් හෝ එයට එරෙහිව නොකඩවා පවත්වාගෙන යා හැකි හෝ බලාත්මක කරනු ලැබිය හැකි විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ දක්වා ඇති අයිතිවාසිකම්, බැඳීම් සහ වගකීම් හැර මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම පැවති ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනයේ අනෙකුත් සියලු අයිතිවාසිකම්, බැඳීම් සහ වගකීම් "ශ්‍රී ලංකා වරලත් බඳුකරණ ආයතනයේ" අයිතිවාසිකම්, බැඳීම් සහ වගකීම් ලෙස සලකනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම වගන්තිය, එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(ආ) නැවත අංකනය කළ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව සංස්ථාවේ සාමාජිකත්වය ලබාගෙන ඇති සහ බඳුකරණ ක්ෂේත්‍රයේ අවුරුදු පහක කාලයක පළපුරුද්දක් අත්කරගෙන ඇති තැනැත්තන්, පාලක සභාවේ අනුමැතියට යටත්ව "වරලත් බඳුකරණ උපදේශකයකු" ලෙස වෘත්තීය කටයුතුවල නියැලීමට සහ ඔවුන්ගේ නම සමග "වරලත් බඳුකරණ උපදේශක" යන පදවි නාමය භාවිත කිරීමට හිමිකම් ලබන්නේ ය.".

(ඇ) එම වගන්තියේ පැති සටහන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:—

"සාමාජිකත්වය සඳහා සුදුසුකම් යනාදිය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් "(අ) සාමාජිකයන් වර්ගීකරණය කරීම, එක් එක් පංතියේ සාමාජිකයා විසින් ගෙවිය යුතු ගාස්තු" යන වචන වෙනුවට "(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන්ට සහතික නිකුත් කිරීම සහ සාමාජිකත්වය අලුත් කිරීම, එක් එක් පන්තියේ සාමාජිකයා විසින් ගෙවිය යුතු ගාස්තු," යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"නමට පසුව අභිධාන භාවිත කිරීම.

9. සංස්ථාවේ අධි සාමාජිකයකුට ඔහුගේ නමට පසුව, එෆ්.සී.අයි.ටී. යන අකුරු ද, සංස්ථාවේ ආශ්‍රිත සාමාජිකයකුට ඒ ආකාරයෙන්ම ඒ.සී.අයි.ටී. යන අකුරුද භාවිත කිරීමට හිමිකම් තිබිය යුතු ය. සංස්ථාවේ ගරු අධි සාමාජිකයකුට හෝ ගරු ආශ්‍රිත සාමාජිකයකුට, ඒ ආකාරයෙන්ම, අවස්ථාවෝචිත පරිදි, ගරු එෆ්.සී.අයි.ටී. හෝ ගරු ඒ.සී.අයි.ටී. යන අභිධාන භාවිත කිරීමට හිමිකම තිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය, එහි "එෆ්.ටී.අයි.අයි. (ශ්‍රී ලංකා), ඒ.ටී.අයි.අයි.(ශ්‍රී ලංකා), ගරු එෆ්.ටී.අයි.අයි.(ශ්‍රී ලංකා) හෝ ගරු ඒ.ටී.අයි.අයි.(ශ්‍රී ලංකා) යන අභිධාන හෝ අකුරු" යන වචන වෙනුවට "එෆ්.සී.අයි.ටී., ඒ.සී.අයි.ටී., ගරු එෆ්.සී.අයි.ටී. හෝ ගරු ඒ.සී.අයි.ටී. යන අකුරු හෝ අභිධාන" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**8.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.